

# ගණිතය

# දෙවන ශ්‍රේණිය

# තුන්වන වාරය

සැකසුම - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව




දෙවන

# කාසි භාවිතයෙන් ගනුදෙනු කිරීම




සැකසුම - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| | | | | |
|---|---|---|---|---|
|  |  |   |  |  |
| පෑනක් | ටොෆියක් | මකනයක් | පැන්සලක් | බොත්තමක් |
| රුපියල් 10 | රුපියල් 2 | රුපියල් 5 | රුපියල් 10 | රුපියලයි |

## දෙමාපියන්ට උපදෙස්

- රුපියල, රුපියල් 2, රුපියල් 5 සහ රුපියල් 10 කාසි එක බැගින් ගන්න.
- එක් එක් කාසිය පෙන්වා කාසියේ වටිනාකම ගැන දරුවාගෙන් විමසන්න.
- ඉහත රූප සටහන පෙන්වා පහත සඳහන් ප්‍රශ්න දරුවාගෙන් අසන්න.

1. රුපියල් 2 ට ගත හැකි භාණ්ඩය කුමක්ද?

   ...........................................................

2. රුපියල් 5 ට ගත හැකි භාණ්ඩය කුමක්ද?

   ...........................................................

3. රුපියල් 10 ට ගත හැකි භාණ්ඩය කුමක්ද?

   .........................................................

4. රුපියලට ගත හැකි භාණ්ඩය කුමක්ද?


   ..............................................................

ඉහත රූපසටහන භාවිතයෙන් පහත සඳහන් ක්‍රියාකාරකමෙහි දරුවා යොදවන්න.


යා කරන්න



රුපියල් 2



රුපියල් 1



රුපියල් 10

## ක්‍රියාකාරකම


කාසි කීපයක් භාවිතයෙන් භාණ්ඩ මිලදී ගැනීම

උදාහරණ: කාසි දෙකක් භාවිතයෙන් පෑනක් මිලදී ගැනීම



රුපියල් 10

රුපියල් 5 + රුපියල් 5

| භාණ්ඩය | මිල ගෙවන ආකාරය |
|---|---|
| පැන්සල  | ____________ + ____________ |
| ටොෆිය  | ____________ + ____________ |
| මකනය  | __________ + _______ + __________ |

# සතියේ දවස් හඳුනා ගැනීම



ඉගෙනුම් සම්පත් :-



- අදාළ මාසයේ දින දර්ශනයක්
- සතියේ දවස් ලියන ලද කාඩ්පත්

| සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා | සෙනසුරාදා | ඉරිදා |
|---|---|---|---|---|---|---|

දෙමාපියන්ට උපදෙස් :-

කිසියම් මාසයක දින දර්ශනයක් පෙන්වා එක් දවසක් වෙත යොමු කරවන්න.

එය ඉරිදා නම් එම දවස හඳුන්වා දෙන්න.


අද දවස | ඉරිදා |

ඉන් පසු සතියේ දවස් හත පිළිවෙළින් කියවන්න.

| සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා | සෙනසුරාදා | ඉරිදා |
|---|---|---|---|---|---|---|

- සතියේ මුල්ම දවස සඳුදා බව ප්‍රකාශ කරවන්න.
- සතියේ අන්තිම දවස ඉරිදා බව ප්‍රකාශ කරවන්න.
- මේ අනුව සතියට දින හතක් (7) ඇති බව කියන්න.
- සතියේ දවස් ලියන ලද කාඩ්පත් හත මේසය මත විසුරුවා හරින්න. ඉන් පසු සඳුදා සිට ඉරිදා තෙක් දින හත පිළිවෙළින් සකස් කරන ලෙස පවසන්න.

## ක්‍රියාකාරකම:




මෙම ප්‍රශ්න වලට පිළිතුරු ලබා ගන්න.

1.සතියේ මුල්ම දවස

2. සතියේ අන්තිම දවස

3. සතියේ දෙවන දවස

4.සතියේ පස්වන දවස

5.සතියේ තුන්වන දවස

## ක්‍රියාකාරකම:-

සතියේ පාසල් යන දවස් තෝරා කොටුව තුළ ලියන්න. ඉතුරු දවස් දෙක රවුම තුළ ලියන්න.

1. ______
2. ______
3. ______
4. ______
5. ______

1.______
2.______


අඟහරුවාදා, සෙනසුරාදා

බදාදා, සිකුරාදා

සඳුදා, ඉරිදා

බ්‍රහස්පතින්දා

# 100 තෙක් සංඛ්‍යා භාවිත කිරීම



සැකසුම- වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## ක්‍රියාකාරකම:- 1

**දෙමාපියන් සඳහා උපදෙස්:**

0 – 9 දක්වා සංඛ්‍යා කාඩ්පත් කට්ටලයක් එක පාටකින් ද, 5 සංඛ්‍යාව තවත් පාටකින්ද සකස් කර ගන්න. ඉන්පසුව 0 – 9 දක්වා සංඛ්‍යා පිළිවෙළින් පහළට සිටින සේ තබන්න. පහත දක්වා ඇති පරිදි එම සංඛ්‍යා ඉදිරියෙන් 5 ඉලක්කම තබමින් සංඛ්‍යා එකින් එක කියවීමට දරුවා යොමු කරන්න. 5 ඉලක්කම පහළට ගෙන යමින් සංඛ්‍යා කියවන්න.

| | | |
|---|---|---|
| 5 | 0 | පනහ |
| 5 | 1 | පනස් එක |
| 5 | 2 | පනස් දෙක ආදී ලෙස සංඛ්‍යා කියවීමට යොමු කරන්න. |
| 5 | 3 | |
| 5 | 4 | |
| 5 | 6 | |
| 5 | 7 | |
| 5 | 8 | |
| 5 | 9 | |

පහත දැක්වෙන අභ්‍යාසය කිරීමට දරුවාට මඟ පෙන්වන්න.

| | |
|---|---|
| 50 | ............................ |
| 51 | ............................ |
| ............................ | පනස් තුන |
| ............................ | ............................ |
| 56 | ............................ |
| ............................ | පනස් හත |
| 58 | ............................ |
| ............................ | ............................ |

- 50 සිට 59 තෙක් අත්පුඩි ගසමින් ගණන් කිරීමට දරුවා යොමු කර , නිරීක්ෂණය කරන්න.
- දෙමාපියන් පෙන්වන සංඛ්‍යාවේ සිට ඉදිරියට ගණන් කිරීමට දරුවා යොමු කරන්න.
  පනස් තුන
  පනස් පහ
  පනස් හත ..................... ආදී ලෙස

**ක්‍රියාකාරකම:- 2**

0 -9 දක්වා ලියූ සංඛ්‍යා කාඩ්පත් කට්ටලය පිළිවෙළින් පහළට තබා 6 ඉලක්කම් 9 ක් ද සකස් කර ඉහත ඉලක්කම්වලට පෙර තබා 60

සිට 69 දක්වා සංඛ්‍යා නිර්මාණය කර කියවීමට දරුවා යොමු කරන්න.

එම සංඛ්‍යා අකුරෙන් ලියූ කාඩ්පත් ද ඉදිරියෙන් තබා ගළපා කියවීමට යොමු කරන්න.

උදා :-

| | | |
|---|---|---|
| 6 | 0 | හැට |
| 6 | 1 | හැට එක |
| 6 | 2 | හැට දෙක |
| 6 | 3 | |
| 6 | 4 | |
| 6 | 5 | |
| 6 | 6 | |
| 6 | 7 | |
| 6 | 8 | |
| 6 | 9 | |

ක්‍රියාකාරකම 1 හා ක්‍රියාකාරකම 2 සිදුකළ ආකාරයට 70 -79, 80-89, 90-99, තෙක් සංඛ්‍යා සකස්කර කියවීමට දරුවා යොමු කරන්න.
පහත දැක්වෙන ආකාරයේ අභ්‍යාස ද නිර්මාණය කර දරුවාට ලබා දෙන්න.
ගැලපෙන ලෙස යා කරන්න.

| | |
|---|---|
| 60 | හැට තුන |
| 63 | හැට පහ |
| 65 | හැට |
| 66 | හැට අට |
| 62 | හැට හය |

| | |
|---|---|
| 69 | හැට නවය |
| 68 | හැට දෙක |

**ගණිතය වැඩ පොතේ 82, 83, 84, පිටුවල අභ්‍යාස කිරීම සඳහා දරුවා යොමු කරන්න.**



# ස්ථානීය අගය හඳුනා ගැනීම

සැකසුම - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව



## දෙමාපියන්ට උපදෙස්

- හුරු කළ යුතු වචන - එකේ ඒවා, දහයේ ඒවා
- සෙන්ටි මීටර 6 ක් පමණ දිග ඉරටු හෝ බීම බට හෝ එවැනි සුදුසු දෙයක් යොදා ගෙන දහයේ මිටි 10 ක් බැඳ දෙන්න. තනි කැබලි ලෙසද කපා ගන්න. (වෙළඳ පොළේ ඩීන්ස් කට්ටල මිලදී ගැනීමට ද තිබේ. මෙය දහයේ දඬු සහ කැට ලෙස තිබේ.)

**ක්‍රියාකාරකම 01**

දහයේ මිටි හා තනි කැබලි භාවිත කරමින් මෙම ක්‍රියාකාරකම කරවන්න. සංඛ්‍යාව ප්‍රකාශ කරවන්න.

- දහයේ මිටි **1** ක එකේ ඒවා **10** යි.
- දහයේ මිටි **2** ක එකේ ඒවා **20** යි .
- දහයේ මිටි **3** ක එකේ ඒවා **30** යි .
- දහයේ මිටි **4** ක එකේ ඒවා **40** යි .
- දහයේ මිටි **5** ක එකේ ඒවා **50** යි .
- දහයේ මිටි **6** ක එකේ ඒවා **60** යි .
- දහයේ මිටි **7** ක එකේ ඒවා **70** යි .
- දහයේ මිටි **8** ක එකේ ඒවා **80**යි .
- දහයේ මිටි **9** ක එකේ ඒවා **90** යි .
- දහයේ මිටි **10** ක එකේ ඒවා **100** යි .

ඩීන්ස් කට්ටලය භාවිත කරන්නේ නම් දහයේ දඬු 1 ක එකේ ඒවා 10 යි . දහයේ දඬු 2 ක එකේ ඒවා 20 යි ලෙස ප්‍රකාශ කරවන්න.

## ක්‍රියාකාරකම 02

දහයේ මිටි හෝ දහයේ දඬු 2 ක් පසෙකින් තබා එකේ ඒවා හතරක් ද තබා සංඛ්‍යාව සාදා පහත ආකාරයේ වගුවක ලියා දැක්වීමට යොමු කරන්න.

| දහයේ ඒවා | එකේ ඒවා | සංඛ්‍යාව |
|---|---|---|
| 2 | 4 | 24 |

මේ අයුරින් සංඛ්‍යා නිරූපණය කරමින් හැකිතාක් වගුවල සටහන් කරවන්න.



## ක්‍රියාකාරකම 03


දහයේ සිට 99 තෙක් සංඛ්‍යා ලියූ කාඩ්පත් සකස් කරදෙන්න. පළමු දිනයේ 10 සිට 19 තෙක් කාඩ්පත් මුනින් අතට හරවා කැමති කාඩ්පතක් අතට ගෙන එහි දැක්වෙන සංඛ්‍යාංකය කොටු පොතෙහි දහයේ ඒවායින් සහ එකේ ඒවායින් පාට කරවන්න. කාඩ්පත් දහය ම ගෙන එසේ කරවන්න. දෙවන දිනයේ ඊළඟ දහය ද, තුන්වන දිනයේ ඊළඟ දහයද, වන පරිදි කාඩ්පත් 100 ක් ගෙන මෙම ක්‍රියාකාරකමෙහි යොදවන්න.

| සංඛ්‍යාංක | දහයේ ඒවා | එකේ ඒවා |
|---|---|---|
| 24 | | |

- ගණිතය පොතේ 85-89 තෙක් පිටුවල අභ්‍යාස ලියන පොතක ඇඳ ,පාටකර සංඛ්‍යා ලිවීමට දෙන්න.



# ද්‍රව්‍ය / රූප ගණන් කිරීම




සැකසුම - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව



## ක්‍රියාකාරකම 01

එකම වර්ගයේ ඇට හෝ ලී කුට්ටි හෝ වීදුරු බෝල හෝ ටොනික් පියන්, බෝතල් මූඩි ආදී ඕනෑම ද්‍රව්‍ය 100 ක් ද ඕනෑම රූප 100 ක් ද යොදා ගන්න. 1-100 තෙක් පුහුණුවන තුරු ගණන් කරවන්න.

## ක්‍රියාකාරකම 02

අවශ්‍ය උපකරණ - කුඩා රබර් බෝලයක් , කුරුම්බ ඇට්ටි වැනි වීසිකිරීමට සුදුසු දෙයක්

- 1-10 ට ගණන් කරමින් බෝලය උඩ දමා ඇල්ලීම.
- 11-20 ට කණට ඉහළින් දෑත් ඔසවා අත්පුඩි ගසමින් ගණන් කරවිම.
- 21-30 ට බෝලය බිම ගසමින් අල්ලන වාර ගණන් කරවීම.
- 31 -40 ට බෝලය අතැතිව දෙපයින් පැන පැන යන වාර ගණන ගණන් කරවීම.
- 41 - 50 ට බෝලය බිම තබා දෑත් ඉදිරියට දිගු කොට අත්පුඩි ගසන වාර ගණන ගණන් කරවීම.
- 51 -60 ට බෝලය අතැතිව තනි කකුලෙන් ඉදිරියට පනින වාර ගණන ගණන් කරවීම.

- 61 -70 ට නැවත බෝලය උඩ දමා අල්ලන වාර ගණන ගණන් කරවීම.

- 81 -90 ට ළමයාට මීටරයක් පමණ දුරින් රවුමක් ඇඳ, සපයා ගත් ද්‍රව්‍ය රවුම තුළට වීසි කරමින් ගණන් කරවීම.
- 91- 100 ට අත් ඉහළට ඔසවා උඩ පනිමින් ගණන් කරවීම.

**සැලකිය යුතුයි - මෙම පනින ක්‍රියාකාරකම් කිරීමට දුෂ්කරතා දක්වන දරුවන් සිටී නම් , එකතැන කරන ක්‍රියාකාරකම් කරමින් ගණන් කරවන්න.**

- ගණිතය පොතේ 90 පිටුව අභ්‍යාස ලියන පොතක චිත්‍ර අන්දවා කරවන්න.
- 100 තෙක් ඕනෑම සංඛ්‍යාවක් චිත්‍ර ඇඳ, ලිවීමට සලස්වන්න.



# සංඛ්‍යා පටිපාටිගත කිරීම



සැකසුම- වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## ක්‍රියාකාරකම



**ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය:**

- අංක 1-100 තෙක් සංඛ්‍යා ලියූ 5cm x5cm ප්‍රමාණයේ කාඩ්පත් 100ක්
- පේපර් ප්ලේට් 3ක්
- මදටිය ඇට හෝ එවැනි ද්‍රව්‍ය 100ක්
- කාඩ්පත් සියල්ලම පහත ආකාරයට මේසයක් මත හෝ පොළොව මතුපිට විසුරුවන්න. ඒ සඳහා ඔබ දරුවාට සහාය වෙන්න.

1 2 3 4 5 6 7 8


9 10 11 12 13 14 15 16

17 18 19 20 21 22

................ ලෙසට

- සංඛ්‍යාපත් සියල්ලම කියවීමට අවශ්‍ය සහයෝගය දරුවාට ලබා දෙන්න.
- ඉහත සංඛ්‍යාපත් වලින් ඕනෑම සංඛ්‍යාපත් දෙකක් තෝරා ගැනීමට පවසන්න.
- ලබාගත් සංඛ්‍යාපත් සඳහා එහි ඇති අගයට ගැළපෙන ද්‍රව්‍ය ප්‍රමාණයන් (මදටිය බීජ හෝ වෙනත් ද්‍රව්‍ය) කාඩ්පතට පහළින් පේපර් ප්ලේට් එක තබා , දමන්න සලස්වන්න.

උදා:-




❖ ඉහත ද්‍රව්‍ය ප්‍රමාණයන් සසඳා විශාල සංඛ්‍යාව සහ කුඩා සංඛ්‍යාව තෝරා කුඩා සංඛ්‍යාව පළමුවත් විශාල සංඛ්‍යාව දෙවනුවත් තබන්න, දරුවාට පවසන්න.
මේ ආකාරයට වාර ගණනාවක් කරන්න.

❖ පසුව කාඩ්පත් තුනක් තෝරා ගෙන එයද ඉහත ආකාරයට කුඩා සංඛ්‍යාවේ සිට විශාල සංඛ්‍යාවට පටිපාටිගත කිරීමට මඟ පෙන්වන්න.

❖ එම සංඛ්‍යා අභ්‍යාස පොතේ ද සටහන් කරවන්න.



# සංඛ්‍යා රටා ගොඩ නැඟීම





**සැකසුම - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# ක්‍රියාකාරකම 1

**පියවර I**

## දෙමාපියන් සඳහා උපදෙස්

පහත දැක්වෙන ආකාරයේ පින්තූර හා සංඛ්‍යා කාඩ්පත් 6 බැගින් සකස් කරගන්න. එය පහත දැක්වෙන ආකාරයට රටාවකට තැබීමට දරුවා යොමු කරන්න.





තැබූ සංඛ්‍යා 2, 3, 2, 3, 2, 3, 2, 3, 2, 3, 2, 3 යනුවෙන් ශබ්ද නඟා කියවීමට දරුවා යොමු කරන්න. තවදුරටත් ගොඩනැඟීමේදී ඊළඟට ආයුතු සංඛ්‍යාව ප්‍රකාශ කිරීමට දරුවාට අවස්ථාව දෙන්න.

**පියවර II**

ඉහත රූප හා සංඛ්‍යා කාඩ්පත් ඇසුරින් තවත් රටාවක් ගොඩ නැඟීමට දරුවාට මඟ පෙන්වන්න.

උදා:-




මෙලෙස සකස්කළ සංඛ්‍යා කියවන්න. මෙහි රටාවක් ගොඩ නැඟී ඇති අයුරු කියා දෙන්න. මෙම පින්තූර හා සංඛ්‍යා කාඩ් මඟින් තවත් රටා කීපයක් ගොඩ නැඟීමට දරුවා යොමු කරන්න.

## ක්‍රියාකාරකම 2

2 4 6 මෙම ඉලක්කම් කාඩ් එකකින් කාඩ් 3 බැගින් කාඩ් පත් 9 ක් සකස් කරගන්න. දෙමාපියන් එක් කාඩ්පතක් තබා ඉදිරියට සංඛ්‍යා රටාවක් ගොඩ නැඟීමට දරුවා යොමු කරන්න. ගොඩ නැඟූ රටා කියවීමට හැම විටම දරුවා යොමු කරන්න.

උදා-

01). 2 4 6 2 4 6

02). 4 2 4 2 4 2

## ක්‍රියාකාරකම 3


පියවර I

**දෙමාපියන් සඳහා උපදෙස්**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 5 | 7 | 9 | 11 | 13 | 15 | 17 | 19 | 1 කට්ටලය |
| 2 | 4 | 6 | 8 | 10 | 12 | 14 | 16 | 18 | 20 | 2 කට්ටලය |

මෙම සංඛ්‍යාපත් කට්ටල දෙක පාට දෙකකින් සකස් කරගන්න. එම සංඛ්‍යාපත් කාඩ් මිශ්‍රකර පිළිවෙළින් 1 2 3 4 ................ 20 තෙක් දරුවා සමඟ පිළිවෙළට තබන්න. එම සංඛ්‍යා කියවීමට දරුවා යොමු කරන්න. ඉන්පසු එක පාටකින් ලියූ කාඩ්පත් ඉවත් කරන්න. අනෙක් පාටින් ලියූ ඉතිරි වූ කාඩ්වල සංඛ්‍යා කියවීමට දරුවා යොමු කරන්න. එහි රටාවක් ඇති බව කියාදෙන්න. පසුව ඉවත් කළ සංඛ්‍යා කාඩ්පත් වෙනත් පේළියකට සකස් කර කියවීමට යොමු කරවන්න.

- ගණිතය වැඩ පොතෙහි පිටු අංක 95 සහ 104 හි අභ්‍යාස කිරීමට දරුවා යොමු කරන්න.



## ක්‍රියාකාරකම 1

**දෙමාපියන් සඳහා උපදෙස්**

එක ඉරටුවකට මල් දෙක බැගින් ඉරටු 10 ක මල් 20 ක් අමුණා ගන්න. එය පහත දැක්වෙන ලෙසට කියවමින් වෙන්කර තැබීමට දරුවාට උදව් කරන්න.

ඉරටු 1 යි මල් 2 යි

ඉරටු 2 යි මල් 4 යි.

ඉරටු 3 යි මල් 6 යි.

..............................................

..............................................

ඉන් පසුව මල් පමණක් 2, 4, 6, 8, 10, ......., 20 තෙක් දෙකෙන් දෙක ගණන් කිරීමට යොමු කරවන්න.



## ක්‍රියාකාරකම 2

**පියවර I** එකම පාටකින් කොඩි 20 ක් වැලක අමුණන්න.

(කොඩි එහා මෙහා කළ හැකි විය යුතුය.)

කොඩි දෙක බැගින් වැලේ එක් පසෙකට කරමින් 2න් 2ක ගණන් කිරීමට දරුවාට උපදෙස් දෙන්න. පසුව කොඩි 1 බැගින් ගණන් කර පිළිතුර නිවැරදි බව පෙන්වා දෙන්න.

**පියවර II** බොත්තම් 16ක්, දත් බෙහෙත් මූඩි 18ක්, ගල්කැට 20ක්, වැනි සපයා ගත හැකි ද්‍රව්‍ය දරුවාට ලබා දී දෙකෙන් දෙක ගණන් කරමින් වෙන් කිරීමට උදව් කරන්න.

## ක්‍රියාකාරකම 3


**පියවර I** මල් 20 ක් ඇඳ හෝ කපා අලවා එය පහසුවෙන් ගණන් කිරීමට හැකි ලෙස දෙකෙන් දෙක වෙන් කිරීමට දරුවා සමඟ සාකච්ඡා කරමින් ක්‍රමයක් යෝජනා කරන්න. (රවුම් කිරීම, යටින් ඉරි ඇඳීම, හරස් ඉරි ඇඳීම හෝ වෙනත් සළකුණක් යෙදීමට දරුවන් යෝජනා කරනු ඇත.)

වෙන් කරන ලද මල් දෙකෙන් දෙක ගණන් කිරීමට යොමු කරන්න.




**පියවර II** පහත දැක්වෙන ආකාරයේ කොටු සැලැස්මක් දරුවාට කඩදාසියක සකස් කර දෙන්න. එහි ඇලවීමට හැකි මල් හෝ කුඩා රවුම් ප්‍රමාණවත් පරිදි දරුවාට ලබා දෙන්න. එක කොටුවක දෙක බැගින් අලවා, එම සංඛ්‍යා කොටු පේළියට ඉදිරියෙන් ලිවීමට දරුවා යොමු කරන්න.

උදා :




- 100 ට අඩු ද්‍රව්‍ය හෝ රූප පමණක් දරුවාට ලබා දී ඉහත ඉගෙන ගත් ආකාරයට දෙකෙන් දෙක වෙන් කරමින් ගණන් කිරීමට දරුවාට අවස්ථාව උදාකර දෙන්න.
- ගණිත වැඩ පොතේ පිටු අංක 107 හි අභ්‍යාසය කිරීමට දරුවා යොමු කරන්න.



# සංඛ්‍යා එකතු කිරීමේ ගැටලු විසඳීම




**සැකසුම - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

## ක්‍රියාකාරකම 1

### පියවර I

**දෙමාපියන් සඳහා උපදෙස්** :දරුවාගෙන් පහත දැක්වෙන ආකාරයේ සරල ප්‍රශ්න කිහිපයක් අසා පිළිතුරු ලබා ගැනීමට උදව් කරන්න.

1) මේසය උඩ ඇපල් ගෙඩි 5 ක් සහ දොඩම් ගෙඩි 4 ක් තිබුණා. ඇපල් ගෙඩි හා දොඩම් ගෙඩි ඔක්කෝම කීයද?
2) සමීර ලකුණු 10 ක් ගත්තා. නිමල් ලකුණු 8 ක් ගත්තා. ඔක්කෝම ලකුණු කීයද?
3) පාසලේ 1 ශ්‍රේණියේ ළමයි 15 ක් ද, 2 ශ්‍රේණියේ ළමයි 10 ක් ද සිටියේ නම් පන්ති දෙකේ ම ළමයි කී දෙනෙක් ඉන්නවා ද?

### පියවර II

1 සිට 9 තෙක් සංඛ්‍යා කාඩ් එක පාටකින් ද, 10 සිට 90 තෙක් සංඛ්‍යා තවත් පාටකින් ද, ලියා බඳුන් දෙකකට දමන්න. ගණන් කළ හැකි ද්‍රව්‍ය 9 ක් ද, ළඟ තබා ගන්න. දෙමාපියන් බඳුන් දෙකටම අත් දමා සංඛ්‍යා 2 ක් ගන්න.

උදා :- ඔබ ගත්තේ 12 සහ 7 නම් මෙම සංඛ්‍යා දෙක එකතු කිරීම පහසුවෙන් සිදු කිරීමට කුඩා සංඛ්‍යාවට (7) ගැළපෙන ගණක හෝ ගණන් කළ හැකි ද්‍රව්‍ය 7 ක් ගෙන 12 සිට ඉදිරියට 13,14,15,.......19 තෙක් ගණන් කිරීමට යොමු කරන්න. පිළිතුර 19 ලැබේ.

මෙලෙස දෙමාපියන් මැදිහත් වී මුලින් සරල ගැටලු සකස් කර දී ද්‍රව්‍ය ද යොදා ගෙන එකතු කිරීම් සඳහා දරුවාට උදව් කරන්න.

1) 21 + 5
2) 22 + 3
3) 32 + 6
4) 41 + 7

මෙවැනි ගැටලු මුලදී ලබා දෙන්න. (එකස්ථානයෙන් ගෙනයාම් සහිත ගැටලු නිර්මාණය කර නොදෙන්න.)

## ක්‍රියාකාරකම 2

දරුවාට 1 සිට 100 තෙක් සංඛ්‍යා ලියූ කාඩ්පතක් (100 යේ කොටු සැලැස්මක්) මෙහි දැක්වෙන ලෙසට සකස් කර දෙන්න.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 | 19 | 20 |
| 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 |
| 31 | 32 | 33 | 34 | 35 | 36 | 37 | 38 | 39 | 40 |
| 41 | 42 | 43 | 44 | 45 | 46 | 47 | 48 | 49 | 50 |
| 51 | 52 | 53 | 54 | 55 | 56 | 57 | 58 | 59 | 60 |
| 61 | 62 | 63 | 64 | 65 | 66 | 67 | 68 | 69 | 70 |
| 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 |
| 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 |
| 91 | 92 | 93 | 94 | 95 | 96 | 97 | 98 | 99 | 100 |

ඉහත ක්‍රියාකාරකම 1 හි පියවර II සඳහා සකස් කළ සංඛ්‍යා 10 සිට 90 තෙක් කාඩ්වලින් එකක් තෝරා ගැනීමට දරුවාට කියන්න. එහි දැක්වෙන සංඛ්‍යාව බොත්තමක් ගෙන, එමඟින් කොටු සැලැස්මේ පෙන්වන්න. එයට එකතු කළ යුතු සංඛ්‍යාව 1 සිට 9 තෙක් සංඛ්‍යා කාඩ් වලින් එකක් ගෙන දරුවාට පෙන්වූ විට එම ප්‍රමාණය කොටු සැලැස්ම තුළ ඉදිරියට ගණන් කළ විට පිළිතුර ලැබේ.

උදා :- දරුවා මුලින්ම 14 සංඛ්‍යා කාඩ්පත ගෙන එය කොටු සැලැස්මේ බොත්තම මඟින් පෙන්නුවේ නම් වැඩිහිටියන් පෙන්වූ සංඛ්‍යාව 5 නම් 14 සිට 5 ක් ඉදිරියට ගණන්කර බොත්තම තැබූ විට පිළිතුර 19 වේ.

14 එකතු කිරීම 5 සමානයි 19 ලෙස කියවීමට දරුවා යොමු කරන්න.

## ක්‍රියාකාරකම 3

පහත ආකාරයේ අභ්‍යාස ද දරුවාට සකස් කර දෙන්න.

උදා :-

| (1) | (2) | (3) | (4) |
|---|---|---|---|
| 3 2 | 4 3 | 5 6 | 6 3 |
| +2 1 | +1 4 | +1 3 | + 2 3 |
| ___ | ___ | ___ | ___ |
| === | === | === | === |

- (එකස්ථානයෙන් ගෙනයාම් සහිත ගැටලු නිර්මාණය කර නොදීමට විශේෂයෙන් වගබලා ගන්න.)
- ගණිත වැඩ පොතෙහි පිටු අංක 97, 98,99, 111 හි අභ්‍යාස සඳහා දරුවා යොමු කරන්න.



# සංඛ්‍යා අඩුකිරීමේ ගැටලු විසඳීම




සැකසුම : වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ඉගෙනුම් සම්පත්: ගල් කැට, ඇට වර්ග, ටොනික් මූඩි වර්ග, හිස් ටින් එකක්

## දෙමාපියන් සඳහා උපදෙස්

❖ ටොනික් මූඩි 8ක් ගන්න. එයින් තුනක් ටින් එකට දමන්න. මේසය මත ඉතුරු ටොනික් මූඩි ගණන අසන්න. (ඉතුරු කීයද?)

ඉහත ගැටලුව කඩදාසියක ලියන්න.


| 8 – 3 = 5 |
|---|

මෙවැනිම ගැටලු තව දෙකක් දෙන්න.

i. 9 – 4 = ? පිළිතුර 5

ii. 7 – 4 = ? පිළිතුර 3

❖ ඉන් පසු පහත ආකාරයට කොටු භාවිතා කර වෙනස සෙවීමට දෙන්න.




❖ අඩු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| 6 | 7 | 5 | 8 | 9 |
| - 2 | - 3 | - 3 | - 4 | - 5 |
| 4 | | | | |


❖ හිස් තැන් පුරවන්න.

| | | |
|---|---|---|
| 6 | 8 | 9 |
| - □ | - □ | - 5 |
| 3 | 5 | □ |

❖ පිළිතුර එකම අගයන් ලැබෙන ගැටලු විසඳීමට දෙන්න.



❖ හිස් කොටු පුරවන්න.




❖ වගන්ති ගැටලු විසඳීමට දෙන්න.

1. අඹ ගොඩක තිබූ අඹ ගෙඩි ගණන = 65
   විකුණූ අඹ ගෙඩි ගණන = 32
   ඉතුරු වූ අඹ ගෙඩි ගණන = ____

2. බෝතලයක තිබූ ටොෆි ගණන = 74
   විකුණූ ටොෆි ගණන = 24
   ඉතුරු වූ ටොෆි ගණන = ____

3. සුපුන් ළඟ තිබුණ වීදුරු බෝල ගණන = 75


මල්ලිට දුන් වීදුරු බෝල ගණන = 34

සුපුන්ට ඉතුරු වූ වීදුරු බෝල ගණන = ____



## ඉගෙනුම් සම්පත් -


- නාදැති පුවරුව (ඇණ ගසා සමාන්තර ගත හැඩැති පුවරුවකි. )
- රබර් පටි
- කාඩ්පත්වල අඳින ලද විවිධ ප්‍රමාණයන්ගේ හැඩතල
- ටින් පියන්




## දෙමාපියන් සඳහා උපදෙස්

විවිධ ප්‍රමාණයේ වෘත්ත , සමාන්තරාස්‍ර, සෘජුකෝණාස්‍ර, හා ත්‍රිකෝණ කපා ගන්න.


වෘත්ත




සමචතුරස්‍ර




සෘජුකෝණාස්‍ර



ත්‍රිකෝණ




ඉහත හැඩතල යොදා ගෙන පහත ආකාරයෙන් විවිධ නිර්මාණ කර දරුවාගෙන් ප්‍රශ්න අසන්න.



මෙමරූපය සෑදීමට යොදා ගෙන ඇති,


(i).වෘත්ත ගණන කීයද?


(ii).ත්‍රිකෝණ ගණන කීයද?



මෙම රොබෝව නිර්මාණය කිරීමට
යොදා ගෙන ඇති ,
(i). වෘත්ත ගණන කීයද?
(ii). ත්‍රිකෝණ ගණන කීයද?
(iii).සෘජුකෝණාස්‍ර ගණන කීයද?
(iv). සමචතුරස්‍ර ගණන කීයද?

හැඩතලය සොයා, දී ඇති පාටින් පාට කරන්න.






නමට ගැළපෙන හැඩතල අදින්න.

වෘත්තය සමචතුරස්‍රය සෘජුකෝණාස්‍රය ත්‍රිකෝණය